රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය**

**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

## SLS 42613 – සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍යය

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03 යි.

---

1. පහත සඳහන් ගද්‍ය පාඨ වත්මන් බසින් ලියා ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ)

ආළාහනෙ, සොහොන්හි. 'ආනෙත්වා දහන්ති එත්ථාති ආළාහනං'. සට්ඨිසකටභාරාලඞ්කාර පතිමණ්ඩිතං, සැට [9]ගැලෙක්හි පිරිය යුතු පමණ පලඳනායෙන් සජනලද. 'සට්ඨියා සකටෙසු හරිතබ්බත්තා සට්ඨිසකටභාරා, තෙ ච තෙ අලඞ්කාරා ච සට්ඨිසකටභාරාලඞ්කාරා, තෙහි පතිමණ්ඩිතං සට්ඨිසකටභාරාලඞ්කාරපතිමණ්ඩිතං.' 'අච්ඡරානං සහස්සං පරිවාරො එතස්සා'ති අච්ඡරාසහස්සපරිවාරො, තං. අයං සිරිසම්පත්ති, මෙ සිරි සැපත්. 'සිරිසංඛාතා සම්පත්ති සිරිසම්පත්ති'. නොහොත් අත්බැවු සිරි හා උපභොගසපුව. 'අයං සිරි අයං සම්පත්ති'යි යොජනු. විප්පකාරප්පත්තං නං, එවුහු විපුවරවතුවහු. පුත්හට පිළියම් නොකෙළෙයින් වන විපිළිසර විප්පකාර නම්. 'විරූපො පකාරො විප්පකාරො'. පිතරි අක්ඛන්තියා, පියා කෙරෙහි උපන් අක්ෂමායෙන්; මට්ටකුණ්ඩලිවණ්ණෙන, මටුකුඬලීහි සැටියෙන්; ධම්මපදෙ ගාථං, ධම්පියෙහි ගා. ධම්මපද නම් සඞ්ග්‍රහයක් එසඳැ නැති බැවින් ''ධම්මපදෙ ගාථං'' යනු නොයෙපේ නො යත්—මතුයෙහි ධම්මපද නම් සඞ්ග්‍රහයෙහි සැහහියයුතු තැන් ගැන කී බැවින් යෙපේ මෙ යැ. බුදුන් සඳහු මෙනියර දෙශනා ධම්මපද නම් යී වෙන් කොට හජාරන බැවින් යෙපේ මෙ. 'ධම්මපදෙ සංගහෙතබ්බා ගාථා' යී කියයුතුයෙහි 'සංගහෙතබ්බ' පද ලොප් කොට කීයේය යි ගන්නේ. ධම්මාභිසමයො, ලොවුතුරාධම් පිළිලැබ; ධම්මයාගො, ධම්මදන; කතසරීරපටිජග්ගනො, කරනලද මුඛධොවනාදි සිරුරු පිළිජග් ඇතියේ.

(ධම්පියා අටුවා ගැටපදය, මහාචාර්ය ඩී.ඊ.හෙට්ටිආරච්චි සංස්.)

(ආ)

සුකුරු මිදියැපියියින් සිහිනෙන් විනා අද ඇයි බැහැපි
වස්ගි හමං යදන් යටා සුකුරු මිදුව සඟවෙසෙස් ඉම
එම ගැම සුක්විසැපි සඟවෙසෙස් නම්.

කායසංසගරුගෙන් මිසිස්මංගමගොහොරර මංගම ගත සැස්
ඇතියා වැ හමරැවන් වත සිහින් කයින් කාය පසර නම්
සඟවෙසෙස් වෙ. ඒම ගැම කායසංසගරසඟවෙසෙස් නම්.

කොනා මාගම්පැවිජ්ජ ලවා පෙරණ සිවුරු දෙවා එවු
රජන්කරවා එවු කොළුවා එවු නියැයි වෙ.

නොනා මාගම පැවිජ්ජ අතින් සිවුරු කිසි වතක් නොදී
ගතීනම් නිසැගි වෙ..

උපසපන්පැවිජ්ජක්හුගෙ පාසිවුරු ආදි පරිකර සොළුහා
රිසින් පැවි කරනු කරවනු කෙරේ නම්—
ඇපියැවි සිසින් සිවිසන්කුදු දිවි ගළුවා නම්—
උපසපන්පැවිජ්ජක්හුගෙ තුළුල්ඇවැතක් පිළිසොයසා
රිසින් පිළිසොයා නම්—

මාගමිසා හා සැදෑ එක්මග පිළිපැද ගමඅතුරකටෙයි නම්—
උපසපන්පැවිජ්ජක්හු දුහැ වැ පහරී නම්—උපසපන් පැවිජ්
ජක්හට දුහැවැ අත්යැක් කියපා නම්—

උපසපන්පැවිජ්ජක්හු මුල් නැයි සඟවෙසෙස්සො
සොයා නම්—

නුරුස්නානාක් කමැවි වැ උපසපන්පැවිජ්ජක්හට කුකුස්
උපසා නම්—

කලහ කමැවි වැ උපන් කලහ ඇත්තවුන් අතියෙසැ සිටැ
නොදක්වා කියනු අසා නම්—

මල්පක්ආදී කුලින් සගන්නා සඳහා දේ නම් දුකුළා වෙ.
මල් ගොතනු ගොපාවනු ආදී කෙරේ නම්—
බුදුන් වැරැනාක් පස වළඳ නම්—
නිසපිළිබුදීයා වැ නිස නොගෙනැ වෙසේ නම්—

(සිඛවළඳ හා සිඛවළඳ විනිස සර් ඩී.බී.ජයතිලක සංස්.)

(ඇ)

සිල් නම් බියමුහුදු තරන මහනැව, රූ නවරන වණ්ණවැටි ය, කුසලසඳ දිනු කිරිමුහුද, කුසල්ධම් හටන බිජුවළ, ගුණරුවන් පිරූ විදුරුදෙණ, බුහුමන්බිගුමුළු වතුළ කුසුම්කැන, හැමසැපත් කැඳවන අත්සන, මරණ නොබන පුරිසර, මුළුලො දස්කළ පත් කරණ, සගමහරුක් හැම්නු දෙරණ, නාදෙව්බඹගජමුඳුන් නමන අකුස්ස, දෙව්ලොමහපා අරන රුවන්හිණ, සතුන් සිරිරු පහයන රසසින, ධම්සක්විතියහට කිරුළුකුළ, හැම මනදෙළ පුරන කප්රුක, සසුන්මහවිල්හි පුබුදු ගුණගඳවහන මහපියුම, තුනුරුවන් උපන් මහසයුර, හැදහැව්ලි හස්මුළු සරන පියුම්විල, දුගීඅඳුරු හරන සරුහිර, මෙත්උලල් සිලියෙන වසාවිට, කෙලෙස් ගජකුඹු පළන සීනියපඳුර, නිවන්පුර වදුත් එක්යහන, සසරසයුරු තරන මහහෙය, රජමුළු කිරුළුකුළු මිණිරස්නි ශේ පාපිළ, සිවු අවයට මහහගුළ දැජරමරණ මහගිම් නිවනුවට මහ මෙයැ, හැමසත්නට අබාද දහම්රජ, අට අකාණ අඳුරු දුරුකරන සරුහිර, අටඅරිකෙලෙඹියන් අත්සරි යැ, බුදුසසුන් රක්නා මහමතුරි.

(ධර්මප්‍රදීපිකාව, රත්මලානේ ධර්මාරාම නාහිමි, සංස්.)

(ලකුණු 8 x 3 = 24)

2. ධම්පියා අටුවා ගැටපදය පදගතාර්ථ විවරණයම අරමුණු කොට රචිත කෘතියක් නොවන බව ඔබේ විමර්ශන ඇසුරින් පැහැදිලි කරන්න.
3. “උපසම්පදාව ලද භික්ෂූන් වහන්සේ විසින් හික්මිය යුතු සිරිත් විරිත් පිළිබඳ සංක්ෂිප්ත සංග්‍රහයක් ලෙස සිඛවළඳ හා සිඛවළඳ විනිස හැඳින්විය හැකිය”. නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
4. “ධර්මප්‍රදීපිකාවෙන් ගුරුළුගෝමීන්ගේ ධර්මඥානය, පාණ්ඩිත්‍යය මතු නොව උසස් කවිත්වය ද හෙළි වේ”. සනිදර්ශනව සනාථ කරන්න.
5. ආරම්භයේ සිට ක්‍රි.ව. දහ වන ශතවර්ෂය තෙක් සිංහල ගද්‍ය සාහිත්‍යයේ විකාසය පිළිබඳ විමසීමක් කරන්න.
6. නියමිත ව්‍යාඛ්‍යාන කෘතියක අර්ථ වර්ණනා ක්‍රම උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.
7. හෙළටුවා සහ සිංහල ගැටපද පිළිබඳ පශ්චාත් කාලීන මූලාශ්‍රය මගින් හෙළි වන තොරතුරු කවරේදැයි විමසන්න.

(02 – 07 පිළිතුරුවලට ලකුණු 09 බැගින්)

@@@@@@@@@